# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 12 දරන ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 10 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1985 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ: ශත 75 යි. තැපැල් ගාස්තුව: ශත 60 යි.

# 1985 අංක 12 දරන ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 2/84.

**ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකාවන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු කීපය මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන අර්ථසිද්ධිය සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1985 අංක 12 දරන ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමයේ දැනට සාමාජිකාවන්ව සිටින තැනැත්තියන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකාවන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තියන්, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා උපාධිධාරී කාන්තා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් හා සංස්ථාවට විරුද්ධව එම නාමයෙන් සියලුම අධිකරණයන්හි නඩු පැවරීම හෝ පවරනු ලැබීම කළ යුතු ය ; එමෙන්ම කරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද එය සංස්ථාවේ කැමැත්ත අනුව වෙනස් කිරීමට ද සංස්ථාවට සම්පූර්ණ බලය සහ අධිකාරය ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ උපාධිධාරී කාන්තාවන් නියෝජනය කිරීම සහ ඔවුන්ගේ ස්වාර්ථයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් ඔවුන් වෙනුවෙන් කටයුතු කිරීම ;

(ආ) ජාති, ආගම් හෝ දේශපාලන මතභේද නොතකා උපාධිධාරී කාන්තාවන් අතර සහයෝගිතාව, මිත්‍රත්වය හා අවබෝධය වැඩිදියුණු කිරීම ;

(ඈ) පර්යේෂණයන් කිරීම සඳහා උපාධිධාරී කාන්තාවන් දිරි ගැන්වීම ;

(ඇ) උගත් කාන්තාවන් විසින් දැරිය යුතු සමාජයේ නිසි වග කීම් කොටස භාර ගැනීමට ඔවුන් දිරිගැන්වීම ;

(ඉ) කාන්තාවන්ට බලපාන යම් යෝජිත ව්‍යවස්ථාදායක හෝ වෙනත් ක්‍රියා මාර්ග ගැන දැන ගැනීමට පරීක්ෂාකාරීව සිටීම සහ සාමාන්‍යයෙන් සියලුම කාන්තාවන්ගේත් විශේෂයෙන් උපාධිධාරී කාන්තාවන්ගේත් අයිතිවාසිකම් හා ස්වාර්ථය ආරක්ෂා කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීම සහ වෙනත් යෝග්‍ය පියවර ගැනීම ;

(ඊ) සමාජ සේවා කටයුතු කිරීම සහ විශේෂයෙන් කාන්තාවන් සහ ළමයින් අතර ද සාමාන්‍යයෙන් අනිකුත් පුද්ගලයන් අතර ද පවත්නා දිළිඳුකම, ව්‍යසනය, රෝගාබාධ, මන්ද පෝෂණය, නූගත්කම හෝ රැකීරක්ෂා විරහිතකම සම්බන්ධයෙන් සහනය සැලසීම සඳහා පුණ්‍ය, අධ්‍යාපනික සහ ශුභසාධක කටයුතු භාර ගැනීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ හා අරමුණුවලට සමාන පරමාර්ථ හා අරමුණු ඇත්තාවූ දේශීය හෝ විදේශීය, සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද වෙනත් යම් සංවිධානාත්මක මණ්ඩලයක් හෝ විශේෂිත නියෝජ්‍යායතනයක් හෝ සංගමයක් සමග අනුබද්ධ වීම, සහයෝගීව ක්‍රියා කිරීම හා ඒකාබද්ධ වීම, ඒවාට දායක වීම හෝ ඒවායේ සාමාජිකයන් වීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික හෝ හිතකර වූ දේ හා සාමාන්‍යයෙන් සංස්ථාවේ සාමාජිකාවන්ගේ යහපත, දියුණුව හා ශුභසිද්ධිය උදෙසා වෙනත් සියලු දේ කිරීම.

(2) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි " උපාධිධාරී කාන්තාවක් " යන්නෙන්, විධායක සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයක් විසින් ප්‍රදානය කරන ලද උපාධියක් දරන කාන්තාවක් අදහස් වේ.

සංස්ථාවේ විධායක සභාව.

4. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවල සඳහන් පරිදි සහ ඊට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකාවන්ගෙන් සමන්විත විධායක සභාවක් මගින් සංස්ථාවේ කටයුතු, එකී රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී ධුර දරන සංගමයේ විධායක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක සභාව විය යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමෙන් පසු පවත්වනු ලබන සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහා සභාව පවත්වන තෙක් එම සභිකයන් සිය ධුර දැරිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

5. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේදී සංගමයේ සාමාජිකාවක වූ සෑම තැනැත්තියකම විසින් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට ඉන් පසුව සාමාජිකාවක ලෙස විධිමත් පරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තියකම විසින් සිය නාමය සටහන් කරවා ගත යුතු ලේඛනයක්, විධායක සභාව විසින් පවත්වා ගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) නාම ලේඛනයෙහි පහත සඳහන් විස්තර අඩංගු විය යුතු ය :—

(අ) එක් එක් සාමාජිකාවගේ නම සහ ලිපිනය ;

(ආ) සාමාජිකාවගේ අධ්‍යාපනික සුදුසුකම් හා ඇය වෙත ප්‍රදානය කර ඇති උපාධි ;

(ඇ) සාමාජිකාවක ලෙස යම් තැනැත්තියකගේ නම නාමලේඛනයේ සටහන් කරන ලද දිනය ; සහ

(ඈ) යම් තැනැත්තියකගේ සාමාජිකත්වය අවසාන වූ දිනය.

6. (1) සාමාජිකාවන් ඇතුළත් කර ගැනීම, අස්කර ගැනීම, ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ නෙරපීම සඳහා ද, සංස්ථාවේ විධායක සභාවේ නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය ඉටු කිරීම පිණිස ද, රැස්වීම් කටයුතු පිළිබඳව අනුගමනය කළයුතු වැඩ පිළිවෙළ සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල සාමාජිකාවන්ගේ යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකාවන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති එසේ සෑදීමෙන් පසු, එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ සෑම සාමාජිකාවක් ම සංස්ථාවේ තත් කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

7. සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සෑම මුදලක්ම පිළිබඳ ගිණුම් නිසි අයුරු තැබීමට සංස්ථාවේ විධායක සභාව විසින් සැලැස්විය යුතු අතර, සෑම වර්ෂයකදීම එක් වරක් වත් සුදුසුකම්ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කරවා සහ විගණනය කරවා අයවැය ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිවැරදිතාවය සහතික කරවිය යුතු ය. සංස්ථාවේ ගිණුම් සහ ඒවා විගණනය කිරීම.

8. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පවත්නා වූ සංගමයේ සියලුම ණය සහ බැරකම් මේ පනතේ කාර්ය සඳහා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය. සංගමයෙන් අයවිය යුතු සහ සංගමයේ ගෙවිය යුතු ණය.

(2) සංගමය එළඹුණු ගිවිසුම් සංස්ථාවේ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

9. ඕනෑම ප්‍රභවයකින් අත්පත් වූ සංස්ථාවේ මුදල් සහ දේපළ හුදෙක් සංස්ථාවේ මෙහි සඳහන් කර ඇති පරමාර්ථ නංවාලීම පිණිසම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකාවන්ට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ලාභ වශයෙන්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය : මුදල් සහ දේපළ යෙදවීම.

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන මගින් —

(අ) සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකාවකට, සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන්, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ගෙවීම;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකාවක විසින් හෝ සංස්ථාවේ සාමාජිකාවක යම් සමාගමක කොටස්කාරියක වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම; සහ

(ඇ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහිලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහිලා, සංස්ථාවේ යම් සාමාජිකාවක, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් විධායක සභාවෙන් කලින් ලබා ගන්නා ලද අනුමතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම හා පියවීම

වළක්වනු නොලැබිය යුතු ය.

දේපළ දැරීමට සංස්ථාවට ඇති බලය.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක් හෝ බද්දක් පිළිබඳ සාධන පත්‍රයක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් යම් චංචල හෝ නිශ්චල දේපළක් අර්ථලාභී අයිතිකරු වශයෙන් හෝ භාරකාරයා වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අත්කර ගෙන තබා ගැනීමට නීතියෙහිලා සංස්ථාවට හැකි විය යුතු අතර ඒ සියලු දේපළ සංස්ථාව විසින් සංස්ථාවේ තත්කාලයේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය යන් සඳහා හෝ භාරයේ කාර්යයන් සඳහා හෝ ඒ භාරය අනුව යන් සඳහා හෝ භාරයේ කාර්යයන් සඳහා හෝ ඒ භාරය අනුව අන්‍යාකාරයකින් සහ (භාරවලට අදාළ යම් ලිඛිත නීතියක සහ අදාළ නියාදන සාධන පත්‍රයේ විධිවිධානවලට සෑම විටම යටත්ව) ඒවා විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාර යකින් බැහැර කිරීමට, බැඳීමකට යටත් කිරීමට හෝ වැය බරකට යටත් කිරීමට සම්පූර්ණ බලය ඇතිව, අදාළ නියාදන සාධන පත්‍රයේ අඩංගු කොන්දේසිවලට යටත්ව, දැරිය යුතු ය.

දේපළ අත්කර ගැනීම, මුදල් ආයෝජනය කිරීම, ණය ලබා ගැනීම ආදිය සඳහා සංස්ථාව සතු බලය.

**11.** සංස්ථාව විසින් —

(අ) සංස්ථාවේ අභිප්‍රායයන් සඳහා අවශ්‍ය වූ ද, එහි අභිප්‍රායයන් සඳහා නීත්‍යානුකූලව අත්කර ගත හැකි වූ ද, ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ අන් ආකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය සඳහා අවස්ථානුකූල යයි සැලකිය හැකි විට ඒවා සම්බන්ධ ගනුදෙනු කිරීම හා ඒවා අන්සතු කිරීම;

(ආ) සංස්ථාවේ අභිප්‍රායයන් සඳහා වහාම උවමනා නොවන යම් මුදල් විධායක සභාවට සුදුසු යයි හැඟෙන ආකාරයකට ආයෝජනය කිරීම සහ එකී ආයෝජනයන් කලින් කල වෙනස් කිරීම හා මාරු කිරීම;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා ඕනෑම ඇපයක් මත මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳී සිටීමක් සුදුසු යයි සිතන ආකාරයකට ආරක්ෂා කිරීම හෝ නිදහස් කිරීම;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා සියලු ආකාරයේ දායක මුදල්, ප්‍රදාන, පරිත්‍යාග සහ තෑගි ඉල්ලීම සහ පිළිගැනීම ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් ගොඩනැගිලි ඉදි කිරීම, වෙනස් කිරීම සහ නඩත්තු කිරීම ;

(ඊ) යම් පුණ්‍යමය කාර්යයක් සඳහා මුදලින් දායක වීම හෝ මුදල් පිළිබඳව ඇපවීම ;

(උ) සංස්ථාව වෙනුවෙන් හෝ වෙන යම් පුණ්‍යමය සංගමයක්, ආයතනයක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක් සහ වෙනත් යම් පුණ්‍ය භාරයක් වෙනුවෙන් භාරයේ තබාගෙන ඇති හෝ හිමි කර ගෙන ඇති, නැතහොත් භාරයේ තබා ගැනීමට හෝ හිමි කර ගැනීමට නියමිත, යම් නීත්‍යානුකූල භාරයක් සහ නිශ්චල හෝ පෞද්ගලික දේපළවලට බලපාන කොන්දේසි සහ වෙන යම් පුණ්‍යමය භාරයක්, භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පාලනය කිරීම ;

(ඌ) උපාධිධාරී කාන්තාවන් සඳහා මූලස්ථානයක් පිහිටුවීම හා නඩත්තු කිරීම සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක ශාඛා හා පර්යේෂණ පැවැත්වීමේ, පුහුණු කිරීමේ, සමාජ හෝ ශුභ සාධක ආයතන වැනි ආයතනයන් පිහිටුවීම සහ සංවිධානය කිරීම ;

(එ) සංස්ථාවට නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසාන කිරීම සහ සංස්ථාව විසින් කලින් කලට තීරණය කරනු ලබන වැටුප්, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ දීමනා ඔවුන්ට ගෙවීම ;

(ඒ) සංස්ථාවේ සිටි හෝ සිටින නිලධරයන්ට හෝ සේවකයන්ට හෝ ඒ තැනැත්තන්ගේ ඥාතීන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ දීම පිණිස යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායකවීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය සඳහා සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද යම් තැනැත්තෙක්, සමාගමක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක්, සමග හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් ගිවිසුමකට ඇතුල්වීම ; සහ

(ඕ) සංස්ථාවේ පරමාර්ථ නිසි පරිදි සහ කාර්ය සාධක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය අනිකුත් සියලු දේවල් කිරීම

නීත්‍යානුකූල වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. විධායක සභාවේ යෝජනා සම්මතයක බලය පිට සහ විධායක සභාවේ සාමාජිකාවන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නො තැබිය යුතු අතර එකී සාමාජිකාවන් දෙදෙනා පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තියකගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සාමාජිකාවන්ගේ බැඳීම සීමා කිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකාවක, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙන යම් කාර්යයක් සඳහා හෝ ඇයගෙන් සංස්ථාවට අයවිය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

14. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු, කවර හෝ යම් දේපලක් ඉතිරි වේ නම්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකාවන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ යම් ආදායමක් හෝ දේපලක් තම සාමාජිකයන් අතර බෙදාදීම තම රීති මගින් තහනම් කරනු ලැබ තිබෙන වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන, සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකාවන් විසින් නිශ්චය කළ යුතු ය. එකී දේපල හෝ ඉන් යම් කොටසක් මෙම වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැහැර කළ නොහැකි නම්, එම දේපල හෝ කොටස සංස්ථාවේ සාමාජිකාවන් විසින් නිශ්චය කරනු ලබන කිසියම් පුණ්‍යමය පරමාර්ථයක් සඳහා යෙදවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.